# <u>මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය</u>
## <u>(2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා)</u>

2017 කාල පරිච්ඡේදයේ මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධනය මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත. කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මූල්‍ය තොරතුරු එහි ඇතුළත්ව ඇත.

### 01. 2018 වර්ෂය සඳහා නිර්දේශ

මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් හා වගකීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 154 ජ වගන්තියෙහි සඳහන් වේ. පළාත් අතර අරමුදල් (ප්‍රාග්ධන හා පුනරාවර්තන) බෙදා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීම ව්‍යවස්ථානුකූල විධිවිධාන අනුව ප්‍රධාන කටයුත්ත වේ.

2018 වර්ෂයේදී ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා වන මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ 2017 නොවැම්බර් 06 වන දින පාර්ලිමේන්තුව වෙත ත්‍රෛ භාෂාවෙන් සකස් කර ඉදිරිපත් කරන ලදී.

### 02. පළාත් සංචාර සහ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා එකඟතාව ලබා දීම

2017 වසරේ දී මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා, ලේකම්වරයා සහ අනෙකුත් අදාල නිලධාරින් සමග සියලු පළාත් වෙත ගොස් වාර්ෂික සැලසුම් සහ වත්මන් ව්‍යාපෘති සමාලෝචනය කරන ලදී. පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ පළාත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් ඇතුළු අනෙකුත් වගකිව යුතු නිලධාරීන් එම රැස්වීම්වලට සහභාගි වූහ.

ඒ අනුව, 2017 වසරේ දී මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සංවර්ධන සැලසුම්වල හඳුනාගත් සමහර සංශෝධනයන් කිරීමට යටත්ව සියලුම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබාදෙන ලදී.

### 03. පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ අයවැය මාර්ගෝපදේශ ලබා දීම - 2018

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත ඉදිරි මුදල් වර්ෂය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන කාර්යයන් පිළිබඳ අවශ්‍යතා තක්සේරු කිරීම හා වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳව මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී. 2018 වර්ෂය සඳහා අරමුදල් අවශ්‍යතා තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය පළාත්වලට යවන ලද අතර, ඒ සඳහා පිළිතුරු එවා ඇත.

### 04. තිරසර සංවර්ධන අරමුණුවලට සමගාමීව, සංවර්ධන සැලසුම්කරණය සඳහා පොදු සැලසුම්කරණ ආකෘතියක් හඳුන්වාදීම - 2018

පළාත් සභාවල සීමිත සම්පත් උපරිම ලෙස උපයෝගී කර ගැනීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සැලසුම් සකස් කිරීමට මාර්ගෝපදේශ ලබාදීම මුදල් කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයකි.

2017 වර්ෂය තුළදී, තිරසාර සංවර්ධන ඉලක්කයන්ට (SDGs) ගැලපෙන පරිදි එක් එක් සංවර්ධන අංශය සඳහා සංරචකයන් හා උප-සංරචක ඇතුළත් වන ලෙස නව සැලසුම් ආකෘතියක් හඳුන්වා දෙන ලදී. සංරචක හා උප සංරචක පළාත් නවයටම පොදු වන අතර, සෑම සංරචකයකටම අදාලව තිරසාර සංවර්ධන

ඉලක්ක සම්බන්ධ කරගත යුතු වේ. සංරචක සහ උප සංරචකවලට අමතරව පළාත් විසින් ආයෝජන සිදු කිරීමට අපේක්ෂාවෙන් සිටින පුළුල් ක්‍රියාකාරකම් පරාස හඳුනාගෙන ඒ යටතේ ක්‍රියාකාරකම් ලැයිස්තු හඳුනාගත යුතුය.

**05. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සංශෝධනය - 2017**

පළාත් විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව, 2017 වාර්ෂික සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාසය දක්වා සංශෝධනයන්වලට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවය ප්‍රදානය කරන ලදී.

**06. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2016**

ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ අනුවාදයන් සහිත 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීම සඳහා 2017 දෙසැම්බර් 05 වෙනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත.

**07. උපාය මාර්ගික සැලැස්ම නැවත සමාලෝචනය කිරීම / ක්‍රියාත්මක කිරීම**

සහභාගිත්ව ප්‍රවේශයකින් උපාය මාර්ගික සැලැස්ම සකස් කර කොමිසම වෙත ඉදිරිපත් කරන ලදී. කොමිසම ප්‍රතිපත්තිමය වශයෙන් එය අනුමත කරන ලදී.

**08. පළාත් විගණන වාර්තා පිළිබඳ වාර්තා සැකසීම**

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලද විගණන වාර්තා, අධ්‍යයනය කරන ලද අතර, ඒ සම්බන්ධව මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණයන් පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට යවා ඇත. මෙම නිරීක්ෂණයන් තුළින් විනිවිදභාවය හා වගවීම වැඩිදියුණු කිරීම හා පළාත් මට්ටමේ විගණන විමසුම් අඩු කිරීම අපේක්ෂා කෙරේ.

**09. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම**

මුදල් කොමිෂන් සභාවේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතියි. මේ සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාවෙහි දී ප්‍රගති සමාලෝචන රැස්වීම් දොළහක් පවත්වන ලද අතර, ව්‍යාපෘති උපදේශක ඒකකය (මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තුවිද්‍යා පීඨය) සහ කොන්ත්‍රාත්කරුගේ සහභාගිත්වයෙන් නිතිපතා මාසික තාක්ෂණික රැස්වීම් වැඩබිමේදී පවත්වන ලදී. දෙසැම්බර් 31 දින වන විට මුළු වියදම, අනුමත මුදල රු. මිලියන 300 න් රු. මිලියන 134 කි. 2017 දෙසැම්බර් 31 වැනි දින වන විට මෙම ව්‍යාපෘතිය නියමිත දිනට දින 109 ක ප්‍රමාදයක් පෙන්විය. ව්‍යාපෘතිය අවසන් කිරීමට 2018 පෙබරවාරි මස 28 දිනට කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇත. මෙම දිගු ප්‍රමාදය හේතුවෙන් 2018 වසරේදී කොමිෂන් සභාව විසින් සතිපතා වැඩබිමේදී රැස්වීම් පැවැත්වීමට සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව වැඩි කිරීමට උපදෙස් ලබා දී තිබේ.

**10. මුදල් කොමිෂන් සභාවේ දත්ත සහ තොරතුරු පද්ධතිය (MIS / DB)**

කොමිෂන් සභාවේ කාර්යභාරය හා එම කාර්යභාරය ඉටු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව සඳහා දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය ඉතා වැදගත් වේ. 2017 අප්‍රේල් මාසයේ දී මේ සම්බන්ධයෙන් කොමිසම විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමග සාකච්ඡා කළ අතර, එහි සභාපතිවරයා වෙත ලිපියක් යොමු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මෙහෙයවීම

සඳහා මුදල් කොමිෂන් සභාව සහ ICTA අතර රැස්වීම් වාර ගණනාවක් පවත්වා ඇත. කෙසේ වෙතත්, ICTA ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් අර්ථවත් ප්‍රතිඵල ලබා ගත නොහැකි විය. ආසියානු පදනමෙහි වියදමෙන් මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට නියමිත අතර, කඩිනමින් ඉදිරි කටයුතු සිදු නොවුවහොත් එම ආයතනයේ සහාය නොමැතිවීමට ඇති ඉඩකඩ පිළිබඳව මුදල් කොමිෂන් සභාවේ අවධානය යොමු විය. යෝජිත MIS/DB සඳහා සහයෝගය ලබාගැනීමට මුදල් කොමිෂන් සභාව විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) සමග සාකච්ඡා ආරම්භ කර ඇත. කෙසේ වෙතත් ICTA ආයතනය විසින්, පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් ලබාදීමක් ඉදිරියේදී සිදු කරනු ලබයි.

## 11. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත

මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමාට යොමු කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් කෙටුම්පත සම්බන්ධයෙන් නිරීක්ෂණයන් ඉදිරිපත් කළ අතර, මුදල් කොමිසම ඊට ප්‍රතිචාර දක්වා ඇත. අදාල පනත සකස් කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට අතිගරු ජනාධිපතිතුමා විසින් 2017 දෙසැම්බර් 15 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

## 12. අධ්‍යයන චාරිකා

මුදල් කොමිෂන් සභාවේ ලේකම් සහ අනෙකුත් අදාල කාර්ය මණ්ඩලය දෙහිවල මහා නගර සභාව සහ කැස්බෑව නගර සභාවෙහි අධ්‍යන චාරිකාවක නිරත විය. මෙම සංචාරයේ අරමුණ වූයේ නගර සභා ව්‍යුහය, රාජකාරි හා වගකීම්, ආදායම් හා වියදම් වර්ගීකරණය, ආදායම් එකතු කිරීම, සංවර්ධන ව්‍යාපෘති, පුස්තකාල කළමනාකරණය, යටිතල පහසුකම් නඩත්තු කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, පෙර පාසැල් අධ්‍යාපනය, සුභසාධන කටයුතු, ඉතිරිකිරීම් හා ආයෝජන සහ සේවක කළමනාකරණය පිළිබඳව අධ්‍යනය කිරීමයි.

## 13. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

### 13.1. දේශීය පුහුණු

මුදල් කොමිෂන් සභාවේ සමහර නිලධාරීන්ට පහත සඳහන් තෝරාගත් ක්ෂේත්‍රයන්හි පුහුණු අවස්ථා ලබා දී ඇත.

- ඵලදායි කළමනාකාරීත්ව කුසලතා
- ව්‍යාපෘති යෝජනා සම්පාදනය
- රාජ්‍ය ඩිජිටල්කරණය
- සයිබර් ආරක්ෂණය සහ ආචාරධර්ම
- ව්‍යාපෘති කළමනාකරණය
- යතුරුලියනය සහ ඩෙස්ක්ටොප් ප්‍රකාශනය
- පුස්තකාල කළමණාකරණය
- පඩි සැකසීම
- ලංසු පත්‍රිකා පිළියෙල කිරීම
- ලිපිගොනු කළමනාකරණය සහ පොදු කාර්යාල පරිපාලනය
- මයික්‍රොසොෆ්ට් එක්සෙල් - උසස් විශ්ලේෂණ ක්‍රම
- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය

## 13.2. විදේශීය පුහුණු

කොමිෂන් සභාවේ නිලධාරීන් හතර දෙනෙකු කැරිබියන් සහ දකුණු පැසිෆික් රටවල් සඳහා රාජ්‍ය මූල්‍ය කළමණාකරණය සහ සේද මාවතේ රටවල්වල ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සම්බන්ධයෙන් වන කෙටි කාලීන (සති 2-3) පුහුණු වැඩසටහනකට සහභාගි වූහ. මෙම වැඩසටහන චීනයේ පවත්වන ලදී.

## 13.3 ආරාධිත දේශන

- ජපාන ජාත්‍යන්තර සහයෝගීතා සංවිධානයේ උපදේශක ෂුනිචිරෝ හොන්ඩා මහතා විසින් ජපාන ප්‍රාදේශීය පාලන ක්‍රමය, මූල්‍යකරණය පිළිබඳව අවධානය යොමු කරමින් දේශනයක් ඉදිරිපත් කරන ලදී.

- ලෝවා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායීතාවය පිළිබඳ හිටපු සහකාර අධිපතිවරයෙකු වන ආචාර්ය එච්.එන්.තේනුවර මහතා විසින් රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය පිළිබඳ දේශනයක් පවත්වන ලදී. එම දේශනයේ දී ප්‍රතිපත්ති අවශ්‍යතාවය, ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පියවර, ප්‍රතිපත්ති පිළිගැනීම සහ රජයේ ආර්ථික කටයුතු වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

- USAID හි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සහ ප්‍රසම්පාදන උපදේශක සරත් මුතුගල මහතා විසින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ අවශ්‍යතාවය, ශ්‍රී ලංකාවේ නූතන පෞද්ගලික ආයෝජනය, සාම්ප්‍රදායික මූල්‍යයේ සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ ප්‍රභේදවල වෙනස්කම් සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ මූලධර්ම පිළිබඳව අවධානය යොමු කරමින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

- විවෘත විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහීම් මෙන්ඩිස් මහතා විසින් මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා "මුදල් කොමිෂන් සභාව සඳහා යහපාලනය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

## 13.4. කාර්ය මණ්ඩල අධ්‍යයන

මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් පැවරූ රාජකාරි යටතේ සිදු කරන ලද වැඩිදුර අධ්‍යයනයන් මත පදනම්ව ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

## 13.5. ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ආදායම් උත්පාදනය වැඩිදියුණු කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම

ආසියානු පදනමේ විධායක අධ්‍යක්ෂ සුභාකරන් අරුමෙමතුරෙයි මහතා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ආදායම් උත්පාදනය ඉහළ නැංවීම පිළිබඳ ඉදිරිපත් කිරීමක් 2017 ඔක්තෝබර් මස 31 වන දින මුදල් කොමිෂන් සභාව සඳහා ඉදිරිපත් කරන ලදී.

**14. 33 වැනි ප්‍රධාන අමාත්‍ය සමුළුව**

33 වැනි ප්‍රධාන අමාත්‍ය සමුළුව 2017 මැයි මස 06 වන දින හබරණ සිනමන් ලොජ්හි දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම සමුළුවට මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා සහභාගී විය.

මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ වූයේ පළාත් නියෝජිතයින්ට පළාත් මට්ටමේ පවතින ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමයි.

**15. බස්නාහිර පළාතේ කෘෂිකර්ම, වාරිමාර්ග හා පශු සම්පත් යන අංශවලට අදාල කරුණු පිළිබඳ රැස්වීම**

මෙම රැස්වීම පළාත් කෘෂිකර්ම, පශු සම්පත් හා වාරිමාර්ග යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් සමග 2017 ඔක්තෝබර් මස 03 වන දින මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ පළාත් කාර්යමණ්ඩලයට පළාත් මට්ටමේ පවතින ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීමයි.

**16. අයවැය වෙන් කිරීම, මාර්ගෝපදේශ හා 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ රැස්වීම**

අයවැය වෙන්කිරීම, මාර්ගෝපදේශ හා 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳව සංවිධානය කරන ලද විශේෂ රැස්වීම් දෙකක් 2017 ඔක්තෝබර් මස 20 හා 2017 නොවැම්බර් මස 21 යන දිනවල මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. සියලුම පළාත්වල ප්‍රධාන ලේකම්වරුන් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) මෙම රැස්වීම්වලට සහභාගි විය.

**17. පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග රැස්වීම**

මෙම රැස්වීම පළාත් කෘෂිකර්ම, පශු සම්පත්, අධ්‍යාපන, පරිවාස හා ළමාරක්ෂක, බටහිර වෛද්‍ය, දේශීය වෛද්‍ය, වාරිමාර්ග හා පළාත් මාර්ග යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂවරුන් / කොමසාරිස්වරුන් සමග 2017 දෙසැම්බර් මස 05 හා 08 යන දිනවල මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ, 2018 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පළාත් කාර්යමණ්ඩලයට අවස්ථාවක් ලබාදීමයි.

**18. පළාත් කාර්යමණ්ඩල තනතුරු ඇති කිරීම හා පුරප්පාඩු පිරවීම පිළිබඳ සාකච්ඡාව**

මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග 2017 දෙසැම්බර් මස 20 වන දින මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ වූයේ, පළාත් කාර්යමණ්ඩලය නිර්දේශ කිරීමේදී හා අනුමත කිරීමේදී එක් එක් ආයතනවල කාර්යභාරය පැහැදිලි කරගැනීම හා පළාත් කාර්යමණ්ඩල කළමනාකරණය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමයි.

## 19. ස්වාධීන කොමිෂන් සභා කාර්යභාරය පිළිබඳව සම්මන්ත්‍රණය

මෙම රැස්වීම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් කොමිෂන් සභා නියෝජිතයින් සමග 2017 ඔක්තෝබර් මස 17 වන දින පවත්වන ලදී. මේ සඳහා මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකු සමග සභාපතිතුමා සහභාගි විය.

මෙම සම්මේලනයේ පරමාර්ථය වූයේ කොමිෂන් සභාවල ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සියලු නියෝජිතයින්ට අවස්ථාවක් ලබාදීම සහ අවශ්‍ය නිර්දේශ ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කිරීමයි.

## 20. ව්‍යවස්ථා සභාව සමග රැස්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ගරු කරු ජයසූරිය මහතාගේ ආරාධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමග රැස්වීමක් පවත්වන ලදී. කාර්යක්ෂම කාර්යමණ්ඩලයක හිඟකම හේතුවෙන් ස්වාධීන කොමිෂන් සභා කාර්යසාධනයට බාධා ඇතිවී ඇති අතර, කොමිෂන් සභා විසින් මේ සම්බන්ධයෙන් සුදුසු පියවර ගත යුතු බව රැස්වීමේ දී තීරණය විය. එම තීරණය අනුව මුදල් කොමිෂන් සභාව විසින් "ස්වාධීන කොමිෂන් සභා සඳහා වෙනම කාර්යමණ්ඩල ව්‍යුහයක්" පිළිබඳව ලිපියක් පාර්ලිමේන්තු මහ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. නව කාර්යමණ්ඩල අවශ්‍යතාවය (කොන්ත්‍රාත් පදනම මත විශේෂඥයින් සහිත) හඳුනාගනිමින් පවතී.

## 21. සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී වීම

ශ්‍රී ලංකා ආර්ථිකය, රාජ්‍ය ආයෝජන වැඩසටහන, තිරසාර සංවර්ධන ඉලක්ක, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP), අධ්‍යාපන හා සෞඛ්‍ය වැනි සම්මන්ත්‍රණ ගණනාවකදී මුදල් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් කිහිපදෙනෙකු සහභාගි විය.

## 22. අභ්‍යන්තර විගණන කමිටුව

කළමනාකරණ සහ විගණන කමිටුව පිහිටවූ අතර, එහි රැස්වීම් තුනක් විගණන අධිකාරිවරයා සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. අවශ්‍ය පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීම සඳහා රැස්වීමේදී ගනු ලැබූ තීරණයන් මුදල් කොමිෂන් සභාවේ සියලු කාර්යමණ්ඩලය වෙත දන්වන ලදී. අභ්‍යන්තර විගණනය, අදාල කටයුතු විධිමත් කිරීමට අමතරව කාර්යසාධනය උදෙසා විය යුතු බව කොමිෂන් සභාව තීරණය කරන ලදී.

## 23. ජාතික හා පළාත් මට්ටමේ මනා සම්බන්ධීකරණය තුළින් සංවර්ධන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුවට අදාල පසු විපරම් කිරීම

2015 ජුනි මස 15 වැනි දින පවත්වන ලද මෙම වැඩමුළුවේ තීරණ හා නිර්දේශ පසු විපරම් කිරීම සඳහා එහිදී හඳුනාගත් ගැටළු සහ නිර්දේශ මත පදනම් වූ පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන ලදී. එම පිරික්සුම් ලැයිස්තුව, ක්‍රියාකාරකම් සැලසුමත් සමග ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ජනාධිපති ලේකම් විසින් එම වැඩමුළුවේ දී ඉදිරිපත් වූ නිර්දේශ පිළිබඳ ප්‍රගතිය විමර්ශනය කිරීමට රැස්වීම් දෙකක් කැඳවා ඇත. අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම

රැස්වීම්වලට සහභාගි වූහ. ජනාධිපති කාර්යාලය විසින් කරන ලද ඉල්ලීම අනුව, මුදල් කොමිෂන් සභාව විසින් වසර තුළ ප්‍රගතිය සමාලෝචනය සිදු කරන ලදී.

**24. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP)**

ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද ආයතනයේ (USAID) සහයෝගය ඇතිව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) පිළිබඳව වැඩමුළු කිහිපයක් සඳහා මුදල් කොමිෂන් සභාව සහභාගි වී ඇත. USAID සමඟ සහයෝගීතාවයෙන් ප්‍රසම්පාදන කොමිසම විසින් මාර්ගෝපදේශයක් සකස් කිරීමට කටයුතු කරනු ඇත.

**25. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව**

2017 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේදීම කාර්තුමය කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

**26. පාලන සංග්‍රහයක්**

මුදල් කොමිෂන් සභාව සඳහා පාලන සංග්‍රහයක් දෙසැම්බර් මස 28 වනදා පැවති කොමිෂන් සභා රැස්වීමේදී සම්මත කරන ලදී. මෙය විනිවිදභාවය, වගවීම සහ කාර්යසාධනය වැඩිදියුණු කරනු ඇත.

**27. විශේෂ අධ්‍යයනයන්**

මුදල් කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය දැක්වීමට විශේෂ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදී. පහත දැක්වෙන මාතෘකා යටතේ එම අධ්‍යයනයන් සිදු කර ඇත.

- පළාත් දළ දේශීය නිෂ්පාදිත විෂමතාව පිළිබඳ වාර්තාවක්
- සෞඛ්‍ය අංශයේ වියදම් පිළිබඳ අධ්‍යයනය
- පළාත් සභා තුළ ක්‍රියාත්මක අධිකාරී පිළිබඳව අධ්‍යයනය
- පළාත් ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය 2006 – 2016
- පුනරාවර්තන වියදම් පිළිබඳව අන්තර් පළාත් සංසන්දනය -2015
- 2015 වර්ෂයේ දී ප්‍රධාන අංශ සඳහා වෙන් කිරීම් සහ වියදම් පිළිබඳව අධ්‍යයනය කිරීම
- ශ්‍රී ලංකාවේ අන්තර් රාජ්‍ය මූල්‍ය සබඳතා
- මාර්ග නඩත්තු වියදම් හා පිරිවැය නැවත අය කිරීම සඳහා වූ යෝජනාව.
- සේවක සංඛ්‍යා සහ පළාත් සභා, පළාත් අධිකාරී සහ පළාත් පාලන ආයතන
- පළාත් පුද්ගල පඩිනඩි වියදම හා කාර්ය මණ්ඩලය
- 2016 – 2017 අතර පළාත් සංවර්ධනය සඳහා අරමුදල් පරතරය
- සමහර මහ නගර සභා පිළිබඳව අධ්‍යයනය
- ප්‍රාග්ධන අරමුදල් භාවිතය
- මහ නගර සභාවල මූල්‍ය අසමතුලිතතාව පිළිබඳ අධ්‍යයනය

**28. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම**

අභ්‍යන්තර විගණක, ප්‍රධාන ගණකාධිකාරී සහ අධ්‍යක්ෂ (පාලන) කොමිෂන් සභාවට බඳවගන්නා ලදී.

**29. කොමිෂන් සභා රැස්වීම් / විධායක නිලධාරීන්ගේ රැස්වීම් / කාර්යමණ්ඩල රැස්වීම්**

- කොමිෂන් සභා රැස්වීම් 15 ක් පැවැත්විණි.
- සෑම කොමිෂන් සභා රැස්වීමක්ම පැවැත්වීමට පෙර උප කමිටුව රැස්වෙන ලදී.
- විධායක නිලධාරීන්ගේ රැස්වීම් - සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් අඛණ්ඩව පවත්වන ලදී.
- කාර්ය මණ්ඩල රැස්වීම් 05 ක් පවත්වන ලදී.

**30. මූල්‍ය තොරතුරු**

2017 වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 50.1 ක්, මුදල් කොමිෂන් සභාව සඳහා වෙන් කරන ලද අතර, පුනරාවර්තන වියදම සඳහා උපයෝජන අනුපාතය 96% කි. පුද්ගල පඩිනඩි පුනරාවර්තන වියදමින් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරයි.

2017 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නව වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක කිරීමත් සමග අතිකාල සහ අනෙකුත් දීමනා වැඩි වීම නිසා පුද්ගල පඩිනඩිවල සුළු වර්ධනයක් දක්නට ලැබෙන අතර මුදල් කොමිෂන් සභාවට නව නිලධාරීන් බඳවා ගැනීම ද ඉහත වැඩිවීමට බලපා ඇත.

ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් කොමිෂන් සභාව රුපියල් මිලියන 102.9 ක් වෙන් කර තිබූ අතර, රාජගිරියේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කර ඇත. ප්‍රාග්ධන වියදම් සඳහා උපයෝජනය 85% කි. 2016 වර්ෂයේදී මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 203 ක් වෙන් වූ අතර, එයින් නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා රුපියල් මිලියන 200 ක් වෙන්වුව ද ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් උපයෝගීතා අනුපාතය 46% කි.

2017 සහ 2016 වර්ෂ සඳහා අයවැයගත වියදම සහ සත්‍ය වියදම පහත පරිදි වේ.

| වැය විෂය | අයිතම විස්තරය | 2017 (රු. 000) | | 2016 (රු. 000) | | ඉතිරිය 2017 (රු. 000) | වියදම % 2017 |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිශෝධිත අයවැය | සත්‍ය | ප්‍රතිශෝධිත අයවැය | සත්‍ය | | |
| | **පුනරාවර්තන වියදම්** | **50,160** | **48,278** | **44,694** | **43,682** | **1,882** | **96%** |
| | **පුද්ගල පඩිනඩි** | **31,239** | **30,107** | **26,617** | **26,338** | **1,132** | **96%** |
| 1001 | වැටුප් හා වේතන | 16,935 | 16,082 | 12,500 | 12,276 | 853 | 95% |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 400 | 377 | 365 | 328 | 23 | 94% |
| 1003 | වෙනත් දීමනා | 13,904 | 13,648 | 13,752 | 13,733 | 256 | 98% |
| | **ගමන් වියදම්** | **248** | **231** | **160** | **124** | **17** | **93%** |
| 1101 | දේශීය | 168 | 159 | 100 | 72 | 9 | 95% |
| 1102 | විදේශීය | 80 | 72 | 60 | 53 | 8 | 90% |
| | **සැපයීම්** | **2,447** | **2,380** | **1,790** | **1,643** | **67** | **97%** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 685 | 677 | 550 | 425 | 8 | 99% |
| 1202 | ඉන්ධන | 1,330 | 1,283 | 1,100 | 1,099 | 47 | 97% |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 25 | 24 | 40 | 32 | 1 | 96% |
| 1205 | වෙනත් සැපයුම් | 407 | 395 | 100 | 86 | 12 | 97% |
| | **නඩත්තු වියදම්** | **2,116** | **2,116** | **2,650** | **2,565** | **0** | **100%** |
| 1301 | වාහන | 1,400 | 1,400 | 2,000 | 1,928 | 0 | 100% |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 711 | 711 | 631 | 630 | 0 | 100% |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තුව | 5 | 5 | 19 | 8 | - | 100% |
| | **සේවා** | **13,310** | **12,689** | **12,742** | **12,295** | **621** | **95%** |
| 1401 | ප්‍රවාහන | 2,700 | 2,317 | 722 | 681 | 383 | 86% |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 1,205 | 1,195 | 1,240 | 1,226 | 10 | 99% |
| 1403 | විදුලිය සහ ජලය | 1,725 | 1,567 | 1,800 | 1,704 | 158 | 91% |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 5,280 | 5,280 | 5,280 | 5,280 | - | 100% |
| 1409 | වෙනත් (සේවාවන්) | 2,400 | 2,331 | 3,700 | 3,405 | 69 | 97% |
| | **මාරුකිරීම්** | **800** | **756** | **735** | **717** | **44** | **95%** |
| **1506** | **රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී** | **800** | **756** | **735** | **717** | **44** | **95%** |
| | **මූලධන වියදම්** | **102,900** | **87,838** | **203,000** | **70,552** | **15,062** | **85%** |
| | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **800** | **701** | **800** | **-** | **99** | **88%** |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300 | 205 | 300 | - | 95 | 68% |
| 2003 | වාහන | 500 | 497 | 500 | - | 3 | 99% |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **1,200** | **1,145** | **1,200** | **1,100** | **55** | **95%** |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 330 | 312 | 360 | 265 | 18 | 95% |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 870 | 833 | 840 | 835 | 37 | 96% |
| | **මානව සම්පත් සංවර්ධනය** | **900** | **863** | **1,000** | **896** | **37** | **96%** |
| 2401 | කාර්යමණ්ඩල පුහුණු | 900 | 863 | 1,000 | 896 | 37 | 96% |
| | **ගොඩනැගිලි හා ඉදිකිරීම්** | **100,000** | **85,129** | **200,000** | **68,556** | **14,871** | **85%** |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 100,000 | 85,129 | 200,000 | 68,556 | 14,871 | 85% |

රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත පරිදි වේ. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව නියමිත සීමාවන් තුළ අත්තිකාරම් බී ගිණුම මෙහෙයවා ඇත.

| **විස්තරය** | **අනුමත සීමාව** | **සත්‍ය සීමාව** |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 3,200,000.00 | 3,186,426.00 |
| අවම ලැබීම් සීමාව | 800,000.00 | 1,662,272.65 |
| උපරිම හර සීමාව | 12,000,000.00 | 7,910,182.85 |